**කැස්බෑව නගර සභාව - 2021**

-----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කැස්බෑව නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කැස්බෑව නගර සභාව මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) නගර සභාවේ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු වුවද නගර සභාව විසින් 2021 වර්ෂයේද වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදි ආයතනය සතු ඉඩම්, ගොඩනැගිලි හා වාහන සඳහා ප්‍රත්‍යාගණනය සිදුකර ගිණුම්ගත කළ බව දන්වා සිටින අතර සභාව සතු අනිකුත් ස්ථාවර වත්කම් සඳහා ප්‍රත්‍යාගණනය සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. | සියළුම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 5 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපලේඛනයන් සමඟ සැසඳීමේදී රු.158,107 ක් වැඩියෙන් හා රු.352,463 ක් අඩුවෙන් දැක්වීම් නිරීක්ෂණය විය. | 2022 අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වා සිටිමි. | වෙනස්කම් හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුවේ. |

2. **මූල්‍ය සමාලෝචනය**
-----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.49,134,973 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ වියදම රු.222,180,148 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**
-----------------------

2.2.1 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**
----------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| නගර සහා ආඥා පනතේ 170 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීමට සභාව කටයුතු නොකිරීම නිසා 2021 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.70,123,464 ක් වූ අතර රු.50,000 ක් ඉක්මවූ වරිපනම් ඒකක 54 කින් අයවිය යුතු හිඟහිටි ශේෂය රු.5,895,415 ක් විය. | 2022.01.01 දිනට මුළු වරිපනම් බදු ශේෂයෙන් රු.50,000 ඉක්මවූ වරිපනම් බදු ඒකක 54 සඳහා හිඟය රු.7,428,663 ක් වන අතර මේ වන විට ඉන් දේපළ 10 කට අදාළව රු.1,533,248 ක් ගෙවා ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ) කසළ බදු** | | |
| 2021 වසර සඳහා කසළ බැහැර කිරීම් වෙනුවෙන් කිසිදු මුදලක් නොගෙවූ ආයතන 24 ක් පැවති අතර එම ආයතන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.1,490,325 ක් විය. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු කසළ බදු වටිනාකම රු.3,086,851 ක් විය. | 2021 වර්ෂයේ කිසිදු මුදලක් නොගෙවූ ආයතන පිළිබඳව තොරතුරු එක් රැස්කරමින් පවතී. ලොව පුරා පැතිර ගිය කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් ව්‍යාපාර ආයතන, තාවකාලිකව ව්‍යාපාර කටයුතු අත්හිටුවීම හා වසා තැබීම මෙයට හේතු වී ඇත. | හිඟ කසළ බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් බෝකුන්දර රජයේ නිවාස වල කුලී පදනම මත දීර්ඝ කාලයක සිට පදිංචිව සිටින කුලී නිවැසියන් 17 දෙනෙකුට ඉඩම් ඔප්පු ලබාදීම සම්බන්ෂ යෝජනාව 2010 පෙබරවාරි 23 දින මහා සභාවේ ඒකමතිකව සහා සම්මත වී තිබුණි. 2021දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම් බෙදා දීම සම්බන්ධයෙන් බවතින ගැටළු නිරාකරණය කර ඔප්පු ලබා දී නොතිබුණි. | නගර සභා ආඥා පනතේ 36 “ඉ” උප වගන්තියේ විධිවිධාන අනුව ඉඩම් බැහැර කිරීමේදී අවශ්‍ය වන පදිංචිකරුවන්ගෙන් අයකරනු ලබන ප්‍රතිෂ්ඨාව මහා සභාව විසින් තිරණය කර ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සඳහා 2021.10.29 දිනැතිව පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021.12.09 දිනැති ලිපියේ අප විසින් යොමු කරන ලද ලියවිලිවල අඩුපාඩු සියල්ල නිවැරදි කර නැවත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට මේ වන විට කටයුතු සිදුකර ඇත. | ගැටළු නිරාකරණය කර ඔප්පු ලබා දීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ප්‍රධාන කාර්යාලය ඉදිකිරීම සඳහා ලැබිය යුතු රු.170,000,000 ක මුදලින් රු.10,000,000 ක් ලැබී තිබුණද රු.160,000,000 ක් 2021 දෙසැම්බර් 31 වන විටත් ලැබී නොතිබුණි. | කැස්බෑව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ පළමු අදියර සඳහා රු.මි.160 ක් හා දෙවන අදියර සඳහා රු.මි.200 ක් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් අයදුම්කර ඇති අතර එම අයදුම්පත් පළාත් පාලන කොමසාරිස්, පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්, ප්‍රධාන ලේකම් හා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර තිබුණද එම ණය මුදල අනුමතවී නොතිබුණි. | ලැබිය යුතු මුදල් නොපමාව ලබාගෙන ඉදිකිරීම් කඩිනම් කළ යුතුය. |
| (ඇ) | 2007 වර්ෂයේ පෞද්ගලික ආයතනකින් අයවිය යුතු රු.169,203 ක අත්තිකාරම් මුදල පියවා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | කොන්ත්‍රාත්තුවේ වැඩ නිමකර නොමැති අතර පියවිය යුතු අත්තිකාරම් මුදල වන රු.169,203 ක් පියවා නොමැත. වසර 12 කට වඩා පැරණි මෙම ලිපිගොනුව සොයාගත නොහැකි වි ඇත. 2019.12.12 දිනැති මහා සභාවේ 5:4 යෝජනාව යටතේ මෙම මුදල් අයකර ගත නොහැකි මුදලක් සේ සළකා ගැළපීම් කිරීමට මහා සභාව අනුමත කරන ලදි. මෙය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශයට ඉදිරිපත් කළ ද නිර්දේශය නොලැබුන අතර | -එම- |

ඊට අදාළව ඉදිරි කටයුතු සිදු කරමින්
පවතින බව දන්වා සිටිමි.

**3.2 කසළ කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වර්ෂය තුළ වෙන් කරන ලද කසළ ටොන් 7179 ක් හා මිශ්‍ර කසළ ටොන් 10474 ක් කරදියාන කසළ අංගනයට භාර දී තිබුණු අතර මුළු කසළ ප්‍රමාණයෙන් වෙන් කළ කසළ ප්‍රමාණය සියයට 42 ක් වී තිබුණි. තවද 2021 වර්ෂයට අදාළ වෙන්කල කසළ වෙනුවෙන් රු.2,605,700 ක් හා වෙන් නොකරන ලද කසළ වෙනුවෙන් රු.11,443,550 ක් සභාව දරා තිබුණි.<br>වෙන් නොකරන ලද මිශ්‍ර කසළ ප්‍රමාණයද වෙන් කළේ නම් ගෙවීමට සිදු වනුයේ රු.3,766,500 කට ආසන්න වූ මුදලක් වන අතර එසේ කසළ වෙන් නොකිරීම හේතුවෙන් රු.7,677,050 ක මුදලක් ගෙවීමට සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය. | කසළ කළමනාකරණය සඳහා යොදවා තිබුණු සේවකයන් කොවිඩ් වෛරස ආසාදිතයන් වීම හා ආශ්‍රිතයන් වීම නිසා කසළ එක්රුස් කිරීමට බාධා පැමිණීම, රට තුළ උද්ගත වූ තත්වය හේතුවෙන් වෙන්කළ කසළ එක්රැස් කිරීමේ වැඩසටහන වූ "කසළ පොල" අඩාළ වීම සභාව සතු පැරණි වාහන නිරන්තරයෙන් අබලන් වීම,<br>වාහන අමතර කොටස් හිඟ වීම මත වාහන නඩත්තුව ප්‍රමාද වීම කසළ වෙන්කොට එක්රැස් කිරීමට බාධා පැමිණීම යනාදී කරුණු නිසා මිශ්‍ර කසළ ප්‍රමාණය වෙන්කළ කසළ ප්‍රමාණයට වඩා ප්‍රමාණාත්මකව වැඩි වී ඇත. | කසළ නිසි පරිදි වර්ගීකරණය කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ලේඛන ගත කරන ලද සම්ප්‍රේෂණ කුළුණු 32 න් 10 ක වටිනාකම තක්සේරු කර නොතිබුණු අතර, තක්සේරු වටිනාකම සහිත කුළුණු 29 න් විගණන දින වන විටත් සභාවට රු.647,466 ක ආදායමක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | නගර සභා බල ප්‍රදේශය තුළ හඳුනාගෙන තක්සේරු කරන ලද සම්ප්‍රේෂණ කුළුණු 32 කින් 2021.12.31 දිනට අයවිය යුතු රු.768,909 ක මුදලින් මේ වන විට සම්ප්‍රේෂණ කුළුණු 03 කින් රු.121,443 ක මුදලක් අයවී ඇති බව දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත සේවකයන්ට අමතරව සභාවේ ව්‍යාපෘති හා අවශ්‍යතා වෙනුවෙන් බඳවාගෙන තිබූ සේවකයින් 46 දෙනෙකුට සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.13,132,057 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | කැස්බෑව නගර සභාවේ සේවා අවශ්‍යතාවය පරිදි ව්‍යාපෘති සේවකයින් සේවයේ යොදවා ගෙන තිබේ. | අනුමත තනතුරු සඳහා පමණක් බඳවාගත යුතුය. |
| (ආ) | **සේවක ණය** | | |
| | නිලධාරින් 05 දෙනෙකුගෙන් වර්ෂ 2011 සිට 2016 දක්වා අයවිය යුතු රු.275,973 ක ණය ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | සේවක ණය ශේෂය ගෙවා අවසන් විමට පෙර සේවය හැර ගොස් සිටින හා මියගොස් ඇති සේවකයින් තිදෙනෙකුගෙන් අය විය යුතු රු.182,360 ක මුදල සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී අදාළ ලිපිලේඛන සොයා ගැනීමට නොහැකි වී ඇත. එසේම යැපෙන්නන් පිළිබඳ තොරතුරු නොමැතිවීම, පෞද්ගලික ලිපි ගොනුවේ සඳහන් ලිපිනයේ කිසිවෙකු නොමැතිවීම යන හේතුන් මත මරණ පරිතෝෂිත අයදුම්පත් ඉදිරිපත් කිරීමටද නොහැකි වී ඇත. සේවකයින් දෙදෙනෙකු සේවය හැර ගොස් ඇති අතර ලිපි මගින් දැනුවත් කර ඇත. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |